# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 අප්‍රේල් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.04.12 දින නිකුත් කරන ලදී)


# ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)

**2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ, ඒ වගන්තිය මගින් ප්‍රදානය කර ඇති නිදහස් කිරීම් ඇතැම් දේපළ සඳහා ව්‍යාප්ත කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඒ වගන්තිය බලාත්මක වන දිනය සංශෝධනය කිරීම වේ.

## ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 11/2018.

### 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 2018 අංක   දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2018 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

*2014 අංක 38 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ආ) බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ නිශ්චිතව දක්වා ඇති යම් සහාධිපත්‍ය දේපළක්:

එසේ වුව ද, අදාළ පැවරුම් ඔප්පුව ලියා අත්සන් කිරීමට පෙරාතුව මුළු වටිනාකම ආමුඛ විදේශීය ප්‍රේෂණ හරහා කලින් ගෙවිය යුතු ය;";

(ආ) එම උපවගන්තියේ (උ) ඡේදයේ "ක්‍රියාකාරීව කටයුතු කර ඇති අවස්ථාවක දී," යන වචන වෙනුවට "ක්‍රියාකාරීව කටයුතු කර ඇති අවස්ථාවක දී; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්;

"(එ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත කර ඇති සමාගමක් වෙත 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව හිමිකම පවරනු ලබන යම් ඉඩමකට.".

2—PL 010739—475 (2018/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය පහත දැකවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ''2017 ජනවාරි මස 8 වන දින'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2016 ජනවාරි මස 1 වන දින'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි පැති සටහනේ ''2017 ජනවාරි මස 8 වන දින'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2016 ජනවාරි මස 1 වන දින'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.